**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.22 පැය 1745 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 121 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## අපරාධ, මත්ද්‍රව්‍ය හා රථවාහන සම්බන්ධව සිදු කරනු ලබන විශේෂ මෙහෙයුම - පොලිස් මූලස්ථානය.

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත 2025.01.12 වන දින ආරම්භ කර දිවයින පුරා පිහිටි පොලිස් ස්ථාන මගින් සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව, මත්ද්‍රව්‍ය ජාවාරම් හා අපරාධ වලට සෘජුවම සම්බන්ධ වී ඇති බවට හඳුනාගත් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුම් තවදුරටත් ක්‍රියාත්මකව පවතී.

මෙම මෙහෙයුම ආරම්භ කර ගතවූ දින 10ක කාලය තුල පුද්ගලයින් 172,877 ක ප්‍රමාණයක් හා වාහන 64,258 ක ප්‍රමාණයක් පරික්ෂාවට ලක් කර ඇත. එම පරික්ෂා කිරීම් රථ වාහන රාජකාරි නියුතු නිලධාරීන් විසින් සිදු කරන දෛනික රථවාහන රාජකාරී වලට අමතරව, විශේෂ රාජකාරියක් ලෙස සිදු කල පරික්ෂා කිරීම් වේ. මෙම මෙහෙයුම මගින් අපරාධවලට සෘජුවම සම්බන්ධ බවට හඳුනාගත් සැකකරුවන් 167 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. එමෙන්ම අධිකරණ මගින් වරෙන්තු නිකුත් වූ සැඟව සිටි වරෙන්තුකරුවන් 2561 ප්‍රමාණයක්ද අත්අඩංගුවට ගන්නා ලදී.

මෙම දින 10ක කාල සීමාව තුළ සිදු කල මෙහෙයුම මගින් ටී. 56 ගිනි අවි 03ක් හා පිස්තෝල ගිනි අවි 03ක් පොලිස් භාරයට ගෙන ඇත. එමෙන්ම මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් මගින් කේරළ ගංජා කිලෝ 462කට ආසන්න ප්‍රමාණයක්, හෂීස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 15 කට ආසන්න ප්‍රමාණයක් හා අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 08 කට ආසන්න ප්‍රමාණයක් පොලිස් භාරයට ගෙන ඇත.

රට තුළ මහජනතාවට බියෙන් හා සැකෙන් තොරව ජීවත්වීම සඳහා අපරාධ අවම යහපත් සමාජයක් ගොඩනැගීම මෙම මෙහෙයුමේ අරමුණ වන අතර, එය සාර්ථක කර ගැනීම සඳහා තවදුරටත් අඛණ්ඩව මෙහෙයුම සිදු කිරීමට පොලිසිය කටයුතු කරනු ලබයි. මෙම මෙහෙයුම් සිදුකිරීමේදී මහජනතාවගේ පූර්ණ සහය ශ්‍රී ලංකා පොලිසිය අපේක්ෂා කරනු ලබන අතර එය සාර්ථකව සිදු කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන මෙන් පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**